## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/119/2024 (PSC)

ඩබ්.ඒ.ඒ.ඩී.යූ.ඉන්ද්‍රජිත්
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.01.29**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් රජයේ සේවක ඩී.ආර්.ඩී.යූ.දිසානායක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ආර්.එම්.පී.ඒ බණ්ඩාර මහතා.

**-<u>නියෝගය</u>-**

### විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

අභියාචක ඩබ්.ඒ.ඒ.ඩී.යූ.ඉන්ද්‍රජිත් යන අය විසින් ඉදිරිපත් කර ඇති **2024.06.11** දාතමින් යුක්ත අභියාචනා පෙත්සමේ 07 වන ජේදයේ සඳහන් කර ඇත්තේ, ඔහුට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා පත්‍රයේ සඳහන් 1, 2 සහ 4 වන චෝදනාවන්ට ඔහු වරදකරු කර තිබීම අයුක්ති සහගත, අසාධාරණ සහ නීතියට පටහැනි බවයි. නමුත්, පෙත්සම මගින් ඔහු විසින් ඉල්ලා ඇති සහන මොනවාද යන්න පැහැදිලිව සඳහන් කර නොතිබුණ හෙයින්, ඒවා පැහැදිලිව ඉදිරිපත් කරන ලෙසට අභියාචක වෙත **2025.02.11** වෙනි දින දන්වා ඇත. ඒ අනුව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද **2025.05.08** දාතමින් යුත් ලිඛිත සැළකිරීම් මගින් ඉල්ලා ඇත්තේ, රාජ්‍ය සේවා කොමිෂන් සභව විසින් නිකුත් කර ඇති විනය නියෝගය බලරහිත කර, සියලු චෝදනා වලින් අභියාචකව නිදොස් කොට නිදහස් කරන ලෙසයි.

අභියාචක වෙත, 2020.01.24 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් චෝදනා 04ක් ඇතුළත් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත. එකී චෝදනා පත්‍රය පහත පරිදි වේ.

I. ඔබ, බස්නාහිර වනජීවී සහකාර අධ්‍යක්ෂ බල ප්‍රදේශයේ රාජකාරී සඳහා ඔබගේ කාර්යාලයට අනුයුක්ත කර ඇති අංක PF-8013 දරණ ඩබල් කැබ් රථය දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය වන පරිදි වනජීවී අධ්‍යක්ෂ ජනරාල්ගේ නිසි අවසරයකින් තොරව පෞද්ගලික කටයුතු සඳහා යොදා ගැනීම මගින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධව පළමු උපලේඛනයේ 15 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.

II. ඔබ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අංක 01/2015 දරණ ගිණුම් චක්‍රලේඛයේ අංක 10 වගන්තිය උල්ලංඝනය වන පරිදි බස්නාහිර වනජීවී සහකාර අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත කර ඇති අංක PF-8013 දරණ ඩබල් කැබ් රථයෙන් 2017.08.01 දින හෝ ඊට ආසන්න දිනක සිට 2018.03.31 දින හෝ ඊට ආසන්න දිනක් දක්වා කාලය තුළ බස්නාහිර වනජීවී සහකාර අධ්‍යක්ෂ කාර්යාලයේ සිට වේයන්ගොඩ වටද්දර පිහිටි ඔබගේ නිවසට යාම් ඊම් කිරීම හේතුවෙන් රු.11,910.62 ක් හෝ ඊට ආසන්න මුදලක අලාභයක් රජයට සිදුකිරීම මගින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධව පළමු උපලේඛනයේ 07 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.

III. බස්නාහිර වනජීවී සහකාර අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත කර ඇති අංක PF-8013 දරණ ඩබල් කැබ් රථය 2017.08.01 දින හෝ ඊට ආසන්න දිනක සිට 2018.03.31 දින හෝ ඊට ආසන්න දිනක් දක්වා කාලය තුළ දින 23ක් හෝ ඊට ආසන්න දින සංඛ්‍යාවක කුලී නිවසක පවත්වා ගෙන යනු ලබන හොරගොල්ල ජාතික උද්‍යාන කාර්යාලය පිහිටි භූමියේ අනාරක්ෂිතව රාත්‍රී කාලයේ නවතා තැබීම මගින් එකී රථයේ

ආරක්ෂාවට අගතියක් වන ලෙස කටයුතු කිරීම මගින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධව පළමු උපලේඛනයේ 08 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.

IV. ඔබ, ඉහත I, II සහ III චෝදනාවල සඳහන් වැරදි එකක් හෝ කිපයක් හෝ සියල්ල සිදු කිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 10 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.

ඉහත සඳහන් චෝදනා නැවත වරක් 2020.10.09 දිනැති ලිපිය මගින් සංශෝධනය කර ඇත. ඒ මගින් චෝදනා පත්‍රයේ සඳහන් ආමන්ත්‍රණය පමණක් සංශෝධනය කර ඇත. එම සංශෝධන මගින් මුල් චෝදනා පත්‍රයේ සඳහන් කරුණු කිසිවක් වෙනස් නොකරන බවටද එහි වැඩිදුරටත් සඳහන් වේ.

ඉහත කී චෝදනා අතරින් 3 චෝදනාවෙන් අභියාචක නිදහස් කර ඇත. ඒ අනුව එකී තුන්වන චෝදනාවට දඬුවමක් පමුණුවා නැත. 1, 2 සහ 4 චෝදනා වලට අභියාචක වැරදිකරු බවට පත්කර ඇත.

පළමුවන චෝදනාව පදනම් කරගෙන ඇත්තේ, වනජීවී අධ්‍යක්ෂක ජනරාල්ගේ නිසි අවසරයකින් තොරව අංක PF-8013 දරණ ඩබල් කැබ් රථය අභියාචක විසින් ඔහුගේ පෞද්ගලික කටයුතු සඳහා යොදාගෙන තිබීම යන කරුණ මතය. දෙවන චෝදනාවට පදනම්ව ඇත්තේ, ඉහත අංක PF-8013 දරණ ඩබල් කැබ් රථය, චෝදනාවේ සඳහන් කාල පරිච්ඡේදයන් තුළදී, බස්නාහිර වනජීවී සහකාර අධ්‍යක්ෂක කාර්යාලයේ සිට වේයන්ගොඩ වටද්දර පිහිටි අභියාචකගේ නිවසට යාම් ඊම් කිරීම හේතුවෙන් රු.11,910.62ක් හෝ ඊට ආසන්න මුදලක අලාභයක් රජයට සිදුකර ඇතැයි කියනු ලබන කරුණ මතය. තුන්වන චෝදනාවෙන් අභියාචක නිදොස් කර නිදහස් කර ඇති අතර, හතරවන චෝදනාව පදනම් ව ඇත්තේ, ඉහතින් දක්වා ඇති චෝදනා තුන මතය. ඒ අනුව පළමු සහ දෙවන චෝදනාවන්ට අභියාචක වරදකරු කර තිබීමේ නිවරද්‍යතාවය සළකා බැලීම අවශ්‍යවේ.

පළමුවන චෝදනාව ඔප්පු කිරීම සඳහා, අංක PF-8013 දරණ ඩබල් කැබ් රථය, වනජීවී අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ නිසි අවසරයකින් තොරව,

අභියාචකගේ පෞද්ගලික කටයුතු සඳහා යොදා ගෙන තිබීම යන කරුණ සාක්ෂි මගින් පැහැදිලිව ඉදිරිපත් කර තිබිය යුතුය. විධිමත් විනය පරීක්ෂණයේදී අභියාචක වෙනුවෙන් වි.1 වශයෙන් ඉදිරිපත් කරන ලද 2019.05.30 දිනැති ලිපිය මගින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් වෙනුවට අත්සන් තබන ලද අධ්‍යක්ෂක (පාලන) විසින් අභියාචක වෙත දන්වා ඇත්තේ, රාජකාරී ගමන් අතරතුර රාත්‍රී කාලය ගත කිරීම සඳහා අභියාචකගේ නිවස හෝ හොරගොල්ල ජාතික උද්‍යානය තෝරා ගැනීමට ඔහුට අවසර ඇති බවයි. ඒ අනුව රාජකාරී ගමන් අතරතුර රාත්‍රී කාලය ගත කිරීම සඳහා අදාළ වාහනය නවතා තැබීම සඳහා ඔහුගේ නිවස පිහිටි ස්ථානය භාවිතා කිරීමට, අභියාචක වෙත අවසර ලබා දී ඇත. එම ලිපියේ සඳහන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා අභියාචක විසින් අධ්‍යක්ෂක ජනරාල් සාක්ෂියට කැඳවීමට අවසර ඉල්ලා සිට ඇතත්, සාක්ෂි ඉදිරිපත් කිරීම ඔහු විසින් ප්‍රතික්ෂේප කර ඇත. එම තත්ත්වය අභියාචකගේ වාසියට හේතුවක් වනවා ඇත.

ඒ සමගම මෙම සිද්ධියට අදාළව මූලික විමර්ශනය පැවැත්වූ විමර්ශන කමිටුවේ සභාපති ලෙස කටයුතු කර ඇති අභ්‍යන්තර විගණක ආර්.පී.සුසන්තා මහත්මිය සාක්ෂිකාරියක ලෙස කැඳවා තිබුණත්, ඇයද සාක්ෂි දීම සඳහා පැමිණ නැත. එයද අභියාචකගේ වාසියට හේතුවක් වනවා ඇත. එයින් පෙනී යන්නේ පැමිණිල්ලේ සාක්ෂිකරුවන් රාජ්‍ය නිලධාරීන් වශයෙන් කටයුතු කර තිබුණත්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් වන කරුණු දැන දැනම ඒවා ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කර ඇති බවයි. ඉහත කී වැදගත් සාක්ෂිකරුවන් දෙදෙනා සාක්ෂි ලබා දීමට නොපැමිණ ඇත්තේ, පැමිණිල්ලට අවාසි සහගත සාක්ෂි ඉදිරිපත් කිරීමට ඔවුන්ට සිදුවන නිසා බවට තීරණය කළ යුතුය.

සාක්ෂියට කැඳවා ඇති එක් අයෙකු වන්නේ, මූලික විමර්ශන කමිටුවේ සාමාජිකයෙක් වන කේ.ඒ.එම්.එම්.නන්දන යන අයයි. ඔහු හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, අභියාචක විසින් වාහනය පුද්ගලික කටයුතු වලට භාවිතා කළ බවට විමර්ශනයේ දී අනාවරණය නොවූ බවයි. (2023.07.27 දින සාක්ෂි සටහන් වල 22 වන පිටුවේ සඳහන් 6 වන ප්‍රශ්නය සහ ඊට ලබා දී ඇති පිළිතුර) ඔහු තවදුරටත් සාක්ෂි දෙමින් මෙම තත්ත්වය සනාථ කර ඇති බව ඉහත කී සාක්ෂි සටහන් වල 11 වන පිටුවේ සඳහන්ව ඇත. විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ අය, එම සාක්ෂි කෙරෙහි නිසි අවධානයක් යොමු කර ඇති බවක් පෙනී යන්නේ නැත.

මීළඟට සාක්ෂි දී ඇති තවත් සාක්ෂිකරුවෙකු වන රියදුරු කේ.ආර්.ජේ.එම්.පී.එස්.පෙරේරා යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහු කුරුණෑගල රාජකාරි කළ අවස්ථාවන්හි දී, රාජකාරි අවසන් කර එන විට පාන්දර වන බවයි. පසුදා පාන්දර වන විට ද පිටත්වීමට ඇති නිසා එලෙස වාහනය අභියාචක පදිංචි ස්ථානයේ නතර කිරීමට සිදුවූ බවයි. සමහර අවස්ථා වලදී, සහකාර අධ්‍යක්ෂක කාර්යාලයේ වාහනය නතර කර තිබුණත්, එහිදී යතුරු භාරදීමට නොහැකි වූ බවත්, එසේ වූයේ රාජකාරි අවසන් වන විට රාත්‍රී වූ නිසා බවටත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

විධිමත් විනය පරීක්ෂණයේදී මතුවූ තවත් වැදගත් කරුණක් වන්නේ අභියාචක විසින් පවත්වනු ලැබූ පරීක්ෂණ සම්බන්ධයෙන් වූ රාජකාරි වල ස්වභාවයයි. ඉහතින් සඳහන් කරන ලද රියදුරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම වකවානුවේ දී පැවරී තිබූ රාජකාරි වල අවධානම් තත්ත්වයක් තිබූ බවත්, අලි ජාවාරම එක්ක වැඩි අවධානමක් තිබුණ බව ඔහුට දැනුන බවත් ය. එම රියදුරු තවදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, අභියාචකගේ වටද්දර පිහිටි නිවසේ වාහනය නැවැත්වීමට අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් සමහර අවස්ථා වල දුරකථනයෙන් හා වාචිකව උපදෙස් ලබාදුන් බව ඔහුට මතක තිබෙන බවයි. විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ අය, ඉහතින් සඳහන් සාක්ෂි කෙරෙහි නිසි අවධානයක් යොමු කර තිබුනේ නම්, අභියාචක පළමුවන චෝදනාවට වැරදිකරු බවට පත්නොකර යුතුව තිබුණි.

දෙවෙනි චෝදනා වන්නේ අභියාචක කාර්යාලයේ සිට නිවසට යාම ඊම හේතුවෙන් රජයට අලාභයක් සිදුකර තිබූ බවයි. ඉහත කී සාක්ෂි අනුවම පෙනී යන්නේ, අභියාචකට ඔහුගේ නිවස කරා වාහනයෙන් ගමන් කිරීමට හේතු වී තිබුනේ, ඔහු විසින් කරන ලද රාජකාරීමය ස්වභාවය හේතුවෙන් බවයි. මේ අවස්ථාව වන විට අභියාචකගේ නිත්‍ය තනතුර වූ (වනසත්ව අඩවි ආරක්ෂක) යන තනතුරේ රාජකාරි වලට අමතරව, සහකාර අධ්‍යක්ෂක (බස්නාහිර) තනතුරේ රාජකාරි කටයුතු ඉටු කරමින් සහ සහකාර අධ්‍යක්ෂක (වයඹ/කුරුණෑගල) ධූරයේ රාජකාරියද ඉටුකරමින් සිට ඇත. එම තත්ත්වය සනාථ කිරීම සඳහා වනජීවී අධ්‍යක්ෂක ජනරාල් විසින් අභියාචක වෙත එවන ලද, **2015.01.30** දිනැති ලිපිය ඉදිරිපත් කර ඇත. එහි පැහැදිලිව සඳහන් කර ඇත්තේ අභියාචක **2015.02.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවා අවශ්‍යතාවය මත බස්නාහිර කළාප කාර්යාලයේ

රාජකාරි ආවරණය කරන සහකාර අධ්‍යක්ෂක වශයෙන් පත්කරන ලද බවයි.

ඉහත සඳහන් කර ඇති පරිදි අභියාචක විසින් බරපතල ගණයේ අපරාධයක් ලෙස සැළකෙන අලි ජාවාරම් සම්බන්ධයෙන් විමර්ශනය කර, ඒ සඳහා වන රාජකාරි කටයුතු වල යෙදී ඇත. එවැනි තත්ත්වයක් යටතේ අභියාචකට රාත්‍රී කාලයේ සේවා නිමවීමෙන් අනතුරුව පොදු ප්‍රවාහන යොදා ගනිමින් නිවසට ගමන් කිරීම අවධානමකට හේතු වන අතර, එසේ කිරීමට හැකියාව ලැබෙන්නේ ද නැත. විධිමත් විනය පරීක්ෂණය සම්බන්ධයෙන් වන තීරණය ලබාදීමේ දී ඉහත කරුණ කෙරෙහි අවධානය යොමු කර ඇති බවක් පෙනෙන්නට නැත.

මෙම අවස්ථාවේ දී මෙම කරුණට අදාළව, මෙම විනිශ්චය අධිකාරය වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ වාර්තාව කෙරෙහි අවධානය යොමු කරන ලදි. 2024.07.29 දිනැති එම නිරීක්ෂණ වාර්තාව, ඉතාමත් කෙටි වාර්තාවක් වන අතර, එහි සඳහන් වන්නේ, විධිමත් විනය පරීක්ෂණයෙන් පසුව අභියාචක වරදකරු කර ඇති බව පමණකි. ඒ හැරෙන්නට එසේ වරදකරු කිරීමේ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් එහි දක්වා නැත. විනිශ්චය අධිකාරය ඉදිරියේ වාචිකව කරුණු දැක්වීමෙන් අනතුරුව නැවත වතාවක් ලිඛිතවද කරුණු ඉදිරිපත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අවස්ථාවක් ලබා දී තිබුණද, එම දෙවෙනි වාර්තාවේ ද සඳහන් කර ඇත්තේ, ප්‍රථමයෙන් ඉදිරිපත් කරන ලද වාර්තාවේ කරුණු හැර වෙනත් කරුණු කිසිවක් ඉදිරිපත් කිරීමට නොමැති බවයි. මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ මෙම සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර නොමැති බවයි.

ඉහත කරුණු සළකා බලා, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති සියළු චෝදනා වලින් ඔහු නිදහස් කරන අතර, ඒ අනුව පනවා ඇති දඬුවම් ද ඉවත් කිරීමට තීරණය කර ඒ අනුව නියෝග කරමු.

ඉහත සඳහන් කරුණු සළකා බලා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින්, අභියාචක වෙත 2024.05.09 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති තීරණය ඉවත් කර, ඒ අනුව නිකුත් කර ඇති වැටුප් වර්ධක එකක් විලම්භනය කිරීම සහ රු.11,910.62ක අධිභාරය අයකර ගැනීමට ගෙන ඇති තීරණයන් ද, පනවා ඇති "**තරවටු කිරීම**" යන දඬුවම ද ඇතුළත් දඬුවම් සියල්ල ඉවත් කිරීමට තීරණය කර ඒ අනුව නියෝග කරමු.

මෙම නියෝගයන් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැනුම් දීමට නියම කරමු.

අභියාචනයට අවසර ලබාදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-